www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවෙහි දෛනික ජීවිතය කෙරෙහි යුද්ධයේ බලපෑම

## The impact of war on daily life in Sri Lanka

**පියසීලි විජේගුණසිංහ විසිනි**
**2005 ජුනි 29**

### ඉර මැදියම, රචනය සහ අධ්‍යක්ෂණය - ප්‍රසන්න විතානගේ

ශ්‍රී ලාංකික චිත්‍රපට නිර්මාතෘ ප්‍රසන්න විතානගේ විසින් මෑත දී අධ්‍යක්ෂනය කෙරුනු ඔහුගේ සිව් වන චිත්‍රපටය ඉර මැදියම දේශීය සිනමා ශාලාවල පසු ගිය දා ප්‍රදර්ශනය කෙරිනි. බෙදුම් වාදී දෙමළ ඊලම් විමුක්ති කොටි සංවිධානය (එල්ටීටීඊ) හා ශ්‍රී ලාංකික යුද හමුදාව අතරෙහි විසි වසරක් මුලුල්ලේ කෙරී ගෙන යන සිවිල් යුද්ධය පසු බිම් කර ගෙන නිර්මිත චිත්‍රපටයට කාලාවධිය ව ඇත්තේ 1996 අගෝස්තු මාසය යි. ඉර මැදියමට ලාංකික ප්‍රේක්ෂකයන් විසින් යහපත් ප්‍රතිචාරයක් දැක්වුනු අතරෙහි එය ජාත්‍යන්තර සම්මාන කිහිපයක් ද දිනා ගත්තේ ය.

ඉර මැදියම යන නමින් ඇඟවුම් කෙරෙනුයේ වසරෙහි වඩාත් ම උෂ්නාධික සමය යි. මෙම සෘතුවෙහි ඉර අහසෙහි මුදුන් වෙයි. විතානගේ විසින් පැහැදිලි ව ම මෙම නම රූපකයක් හැටියට යොදා ගැනේ. යුද්ධයෙන් හැට දහසකට වැඩි පිරිසක් මිය ගිය බවට ගනන් බලා ඇත. දශ ලක්ෂයකට වැඩි පිරිසක් අව තැන් කෙරී හෝ නිවාස අහිමි වූවන් කෙරී ඇත. මෙයින් අවධාරනය කෙරෙනුයේ, දෙමළ සුලුතරයට විරුද්ධ ව දියත් කෙරුනු යුද්ධයෙන් සාමාන්‍ය මහජනතාවන් විඳින දුක් පීඩා උච්ච ස්ථානයකට සේන්දු ව ඇති බව යි. ලේ වැකි ගැටුම පසු ගිය තෙවසර මුලුල්ලේ තාවකාලික ව හිරි වට්ටනු ලැබ ඇතත් සටන් විරාම ගිවිසුම බෙහෙවින් ම අස්ථාවර වී තිබේ. වර්ධනය වන දේශපාලන ආතතීන් හා සිංහල ස්වෝත්තමවාදීන්ගේ අනවරත උද්ඝෝෂන කරන කොට ගෙන යලි වතාවක් පරිපූර්න යුද්ධයක් පුපුරා යාමේ තර්ජනය ඉස්මතු වෙයි.

චිත්‍රපටය එකිනෙකින් වෙන් වූ එහෙත් එක විට දිග හැරෙන, අන්තර්-වියමනකින් යුක්ත වන කතා තුනකින් සමන්විත වෙයි. චිත්‍රපටය විකාසනය වෙද්දී එක් එක් කතාවෙහි චරිත අනෙක් කතාවල චරිත සමග එක ම මාවතක දී මුනගැසෙන අවස්ථා වෙතත් ඒවා අතර සන්නිවේදනයක් සිදු නො වේ. කෙසේ වෙතත් ඔවුන්ගේ ජීවිත සම්බන්ධිත සියල්ලක් ම යුද්ධය විසින් නිර්නය කෙරේ.

පලමුවන කතාවෙන් කියවෙනුයේ නිවාඩුවක් ගත කරන සොල්දාදුවකු පිලිබඳ පුවතකි. දුමිඳු (නාමල් ජයසිංහ) නමැති මෙම සොල්දාදුවා, මිතුරන් දෙදෙනෙකු ද කැටුව අනුරාධපුරයට පැමිනෙයි. ඉපැරනි බෞද්ධ සිද්ධස්ථාන රැසකින් සමන්විත, ශුද්ධ නගරයක් සේ සැලකෙන, අනුරාධපුරය පිහිටා තිබෙනුයේ උතුරේ යුද බිමත් ශ්‍රී ලංකාවේ දක්ෂින ප්‍රදේශයත් අතරෙහි ය. ශ්‍රී ලාංකික යුද හමුදාවට යුද්ධ භටයන් බහුතරයක් බඳවා ගැනෙනුයේ මෙම දක්ෂින ප්‍රදේශයෙනි. නිවාඩු ලබන සොල්දාදුවන්ට අනුරාධපුරය තමන්ගේ අතිශයින් ම පීඩාදායී අත්‍යේත්තීන් හා අසහනයන් මුදා හැරීමේ තැනක් බවට පත් ව ඇත. සොල්දාදුවෝ තිදෙන ගනිකා නිවාසයකට යාමෙන් තමන් ද මෙම පිලිවෙත අනුගමනය කරත්.

දුමිඳු, තම නැගනිය කමනී (නදී කම්මැල්ලවීර) මෙම ගනිකා නිවාසයෙහි ගනිකාවක වන බව දැන ගැනීමෙන් විස්මය ප්‍රාප්ත වෙයි. කෝපාවිෂ්ට වන ඔහු තරුන ගැහැනු ලමයාට පහර එල්ල කරයි. ඈ ගනිකා නිවාසය හැර දා පෙරලා ගෙදර පැමිනෙයි. දුමිඳු කෝපය සංසිඳුනු පසු තම නැගනිය බලන්නට ගමට ගොස් ඇයට කරාබු කුට්ටමක් තෑගි කරයි. දුමිඳුගේ මව බාගෙට ඉදි කෙරුනු නිවස සම්පූර්න කිරීමටත් තම දියනියට දෑවැද්ද දීමටත් පුතාගේ ආදායම මත අපේක්ෂාව රඳවා සිටී. මව තම දියනිය මුහුන දෙන දුෂ්කරතා ගැන නො දන්නී ය. දියනිය ගනිකාවක බවට පත් වන්නේ කර්මාන්ත ශාලාවක කල රැකියාව අහිමි වී ගිය පසු ව ය.

දෙවන කතාවෙන් කියවෙනුයේ ආන්ඩුවේ ගුවන් හමුදාවේ ගුවන් නියමුවකුගේ සහකාරිය වන චමරී (නිම්මි හරස්ගම) පිලිබඳ ව ය. ගුවන් නියමුවාගේ යානයට උතුරේ සංග්‍රාම භූමියෙහි කිසියම් තැනක දී වෙඩි තබා එය බිම හෙලා ඇත. තම සහකරු ජීවත් ව සිටිති යි ද එල්ටීටීඊ සංවිධානය ඔහු රඳවා ගෙන සිටිති යි ද විශ්වාස කරන චමරී ඔහු මුදවා ගැනුමේ දැඩි අවශ්‍යතාවෙන් පෙලෙයි. එල්ටීටීඊය සමග සම්බන්ධතා ඇතැයි සැලකෙන රූපවාහිනී නිවේදකයකු වන සමන් (පීටර් ඩි අල්මේදා) වෙත එලඹෙන චමරී තමන් සමග උතුරට යාමට එන ලෙස ඔහුට බල කරයි. කෙසේ වෙතත් ඔවුන් උතුරට ගොස් කරන ගවේෂනය එල දරන්නේ නැත.

අන්තිම කතාවෙන් උතුරේ සිටින මුස්ලිම් වාර්ගිකයන් මුහුන දෙන කොන්දේසි අනාවරනය කෙරේ. ශ්‍රී ලාංකික යුද්ධ හමුදාවට ඔත්තු සැපයීම සම්බන්ධයෙන් චෝදනාවන්ට පාත්‍ර වන මුස්ලිම් පවුල් එල්ටීටීඊ සංවිධානය විසින් බොහෝ විට වාසස්ථානවලින් පලවා හරිනු ලැබේ. චෝදනාවන්ට පාත්‍ර වූවන්ට තම නිවාසවලින් පිට වීමට දෙනු ලැබෙනුයේ පැය දොලහක කාලයක් පමනි. මෙම කතාවෙන් මුස්ලිම් රෙදි වෙලෙන්දෙකු වන හසන් (ඒ.ඒ. මන්සූර්) සහ ඔහුගේ පවුල මුහුනදෙන තත්වය නිරූපනය කෙරේ. හසන්ගේ කුඩා පුත්‍රයා වන අරෆාත්ට (මොහොමඩ් රෆියුලා) තම සුරතලාගෙන් (නන්නත්තාර බල්ලෙකුගෙන්) වියෝ වීමට සිදු වෙයි.

ගම්මුන්ට පිට වෙන විට රැගෙන යාමට අවසර ඇත්තේ රුපියල් 3,000ක (එක්සත් ජනපද ඩොලර් 30) මුදලක් පමනි. එහෙත් රෙදි වෙලෙන්දාගේ බිරිඳ (රජීනා බෙගම්) පවුල ඉතිරි කල මුදල් සඟවා ගෙන යනු පිනිස තම යට සායට හොර සාක්කුවක් මසා ගනී. සෝදිසි කරන්නන්ට හසු නො වී මුර පොල පැන ගැනුමට තරම් ඇය වාසනාවන්ත වුවත් ඇතැමෙක් එතරම් වාසනාවන්ත නො වෙත්. ට්‍රාන්සිස්ටර් රේඩියෝවක මුදල් ටිකක් සඟවා ගෙන ආ ගැහැනියක අතින් රේඩියෝව ගිලිහී බිම වැටුනු විට එල්ටීටීඊ කේඩර්වරු වහා ම ඇය වටකර ගනිත්.

## හොඳ පිටපතක්

මැතකාලීන ශ්‍රී ලාංකික සිනමාව සමාජීක ගැටලු විෂය කර ගන්නා හොඳ පිටපත් හිඟයකින් පෙලේ. එසේ නොවන ඉර මැදියම යුද්ධය විසින් මානුෂ සම්බන්ධතාවල ඇති කෙරී තිබෙන විනාශය කල්පනාකාරී ලෙස උද්දීප්ත කොට ගෙන හැර දක්වයි.

විතානගේ තම මුල් කෘතිවලින් කල පරිද්දෙන් ම මෙහි දී ද සාමාන්‍ය ජනතාව මුහුන දෙන දුෂ්කරතාත් ජීවිතයෙන් කිසියම් සතුටක් විඳ ගැනුම උදෙසා ඔවුන් කරන අරගලයත් ප්‍රේක්ෂක අවධානයට පාත්‍ර කරයි. තම මුල් වාසස්ථානයෙහි එලවලු පාත්තියක් වගා කල මුස්ලිම් කාන්තාවක තම වාසභූමියෙන් පලවා හරිනු ලැබුනු පසු ව මැටි බඳුනක පැලෑටියක් වගා කිරීමට දරන උත්සාහය ඊට නිදසුන් වෙයි.

ඉර මැදියමෙහි නිරූපිත පරිකල්පන රූප අතරෙහි වඩාත් ම සිත කම්පා කරවනුයේ මුස්ලිම් පිරිමි දරුවා හා ඔහුගේ සුරතලා අතරෙහි සම්බන්ධතාව යි. පවුල ත්‍රිරෝද රථයකින් නිවස හැර දමා යන විට බල්ලා අත් නො හැර ම රිය පසුපස ලුහුබඳියි. පවුල මෝටර් බෝට්ටුවක නැගී විශාල කලපුවෙන් එතෙර වන විට කිසිවක් කර කියා ගත නොහැකි ව බල්ලා තනි වෙයි. බල්ලා නැති වීම ගැන දරුවා හඬා වැටෙන විට පියා ඔහුට බැන වදිනුයේ මුස්ලිම් මිනිසුන් හුරතලුන් හැටියට බල්ලන් ඇති නො කරන බව ද පහදා දෙමිනි. කෙසේ වෙතත් පිරිමි දරුවා අලුත් මිත්‍රශීලී බලු පැටවකුට ප්‍රතිචාර දක්වීමට යුහුසුලු වෙයි.

ඉර මැදියමෙහි විතානගේ විසින් මුලින් නිර්මිත පුර හඳ කලුවරට සමාන වන තැන් බොහෝ වෙතත් ඉර මැදියම තාක්ෂනික වශයෙන් වඩා පරිපූර්න කෘතියක් වෙයි. එයින් ප්‍රබල යුද විරෝධී හැඟීම් ද ජනනය කෙරේ. සිවිල් වැසියන් බෝම්බවලට ගොදුරු කර ගනු නොලැබෙන බව ආන්ඩුවේ ප්‍රචාරක මාධ්‍යවලින් ප්‍රකාශ කෙරෙතත් ගැමියන්ට බෝම්බවලින් ආරක්ෂා වීමට බොහෝ විට රක්ෂා ස්ථානවලට රිංගා ගැනුමට සිදු වන අයුරු චිත්‍රපටයෙන් විදහා දක්වෙයි.

විතානගේ පැහැදිලි ලෙස ම වර්තමාන ඉරාන සිනමාවෙන් ආභාසය ලබයි. මෙය වෘත්තීය නො වන නලුවන් හැසිරවීමෙහි පටන් විවිධාකාරයන්ගෙන් චිත්‍රපටයෙන් ප්‍රකට වෙයි. වාසභූමිවලින් නෙරපනු ලැබෙන මුස්ලිම් ජනතාවන් පිලිබඳ රූපරාමු වෙසෙසින් බලගතු ය. චිත්‍රපටයට සම්බන්ධ කර ගෙන තිබෙන වෘත්තීය නලුවන් ස්වල්ප දෙනාගෙනුත් අධ්‍යක්ෂවරයා ප්‍රබල රඟපෑම් උද්ධරනය කර ගනියි. පීටර් ඩි අල්මේදාගේ හා නිම්මි හරස්ගමගේ රඟපෑම් විශිෂ්ට ය. එසේ ම සංස්කාරක ශ්‍රී කාර් ප්‍රසාද් දක්ෂ ලෙස කතා තුන එකිනෙක ගලපා ඇත. චිත්‍රපටය සුගම ලෙස දිග හැරෙන අතරෙහි කිසිදු විසංවාදී ධ්වනියක් නො නැංවෙයි. අධ්‍යක්ෂවරයාගේ මුල් කෘතිවල දිස්වූ එම සම්භාව්‍ය සරල භාවය මෙම කෘතියෙහි ද දැක ගත හැකි ය.

විතානගේ පූර්වයෙන් අධ්‍යක්ෂනය කල පුර හඳ කලුවරෙන් සේ ම මෙම චිත්‍රපටයෙනුත්, මහ ජනතාව මුහුන දෙන සමාජ යථාර්ථයත් ආගමික ආයතනවලට ඔවුන් හට ප්‍රදානය කිරීමට ඇති දේත් අතරෙහි පවත්නා පැහැදිලි පරස්පර විරෝධය ඉස්මත්තට ගැනේ. බෞද්ධ ආයතන විසින් ජනතාවගේ 'සුබ සෙත' සඳහා යැයි බෙදා හැරෙන සෙත් පිරිත් ගායනය ඊට එක් නිදසුනකි. ගරා වැටුනු චෛත්‍ය (බුදුන්ගේ ධාතු නිදන් කොට ගොඩනැගුනු ඉපැරනි ගොඩනැගිලි) දැක්වෙන රූපරාමු සමාජයේ දෘෂ්ටිවාදීමය කනු වීම ප්‍රබල ලෙස සංකේතවත් කරයි. ඉර මැදියමෙහි දක්වෙන ආලෝක කෙරුනු චෛත්‍යය ආගමික ස්මාරකයකට වඩා ග්‍රාම්‍ය වානිජමය ප්‍රේක්ෂාවක ස්වභාවය උසුලයි.

චරිත, තමන් මුහුනදෙන දවැන්ත දුෂ්කරතා හමුවෙහි තම සිත්සතන් හිරි වට්ටවා තබා ගැනුමට ආගම උපයෝග කර ගන්නා අයුරු විතානගේ විසින් නිරූපනය කෙරේ. තම ප්‍රේමනීය සහකරු සොයා ගැනුමට දරන ආයාසය මල්ඵල ගන්වා ගනු පිනිස, ගුවන් නියමුවාගේ සහකාරිය වන චමරී අශ්වයකුගේ පිලිමය අබියස පොල් ගෙඩියක් ගසා අශ්ව පිලිමයට යාඥා කරයි. එසේ ම පූජකවරයා හමු වීමට සමන් සමග දේවස්ථානයට ගිය අවස්ථාවෙහි දීත් ඈ යාඥාවෙහි නියැලෙයි.

එල්ටීටීඊය විසින් නිවසින් පලවා හැරුනු මුස්ලිම් කාන්තාවක් තමන් ගමන් කරන මෝටර් බෝට්ටුවේ යන්ත්‍රය නතර වූ විට වහා ම අල්ලාට යාඥා කරයි. යන්ත්‍රය යලි පන ගැන්වුනු විට ඇය අහස දෙසට නෙත් යොමනුයේ දෙවියන්ගේ මැදිහත් වීමට කෘතඥතාව පල කරන සෙයියාවෙනි. අහසට යොමු කෙරුනු ඇගේ මුහුනෙහි මඳ සිනාවක් මතු වෙයි.

*පුර හඳ කළුවර* චිත්‍රපටයෙහි ප්‍රධාන චරිතය වන්නිහාමි, සොල්දාදුවකු වූ තම පුතා යුද්ධයෙන් මිය ගියේ යැයි විශ්වාස නො කරන හෙයින් පුතාගේ මරනය වෙනුවෙන් රජයෙන් ගෙවන වන්දිය ගැනුම ප්‍රතික්ෂේප කරයි. එමෙන් ම චමරී ද තම සහකරු මිය ගොස් ඇතැයි විශ්වාස කිරීම ප්‍රතික්ෂේප කරයි. ඇ අධිකාරීන් විශ්වාස නොකොට අලා මුලා සහගත ඵල රහිත ගවේශනයක නිරත වෙයි.

*පුර හඳ කළුවරට* සමාන වන තවත් තැනක් නම් විශේෂයෙන් ම චිත්‍රපටයෙහි අග කොටසට වන්නට ආතතිය ලිහිල් වී යාම යි. චමරී තම ගවේෂනයට ආධාරක විය හැකි පුවත්පත් නිවේදනයක් කියවීමෙන් පසු ව තම සහකරු සොයා ගැනුමට යලි වතාවක් උතුරට චාරිකාවක යෙදෙන්නට තීන්දු කරයි. සොල්දාදුවා ගමට ගොස් තම පවුලේ උදවිය දැක බලා ගැනුමෙන් අනතුරුව පෙරලා යුද පෙරමුනට යාමට ගමන් අරඹයි. මුස්ලිම් රෙදි වෙලෙන්දා අලුත් ස්ථානයක තම ව්‍යාපාරය නැවතත් අරඹයි. මේ වතාවෙහි ඔහු බයිසිකලයක රෙදි බැඳ ගෙන ගොස් ඒවා විකුනයි. ඔහුගේ පුත්‍රයා සුරතල් කිරීමට අලුත් බලු පැටවකු සොයා ගනී.

*ඉර මැදියමෙහි* චරිත ඔවුන් මුහුන දෙන බැරෑරුම් අභියෝග තිබිය දී ම, තමන්ගේ ජීවිතවල කිසියම් සාමයක් හා ස්ථාවරත්වයක් ගොඩනගා ගැනුමට අධිෂ්ඨාන සහගත වෙත්. මෙම මුඛ්‍ය තේමාව, එනම්, සියලුම ආකාරයේ දුක්පීඩාවන්ට හා අගහිඟකම්වලට විරුද්ධ ව මහජනතාවගේ මූලික ප්‍රේරනය, පැහැදිලි ලෙස ම වැදගත් වෙතත් මෙම සාමාන්‍ය සත්‍යයෙන් ඔබ්බට යාමට හෝ යුද්ධයේ සම්භවයන් පිලිබඳ ව, එසේ ම එය නැවත හට ගැනුම සාමාන්‍ය ශ්‍රී ලාංකිකයන්ට නිරන්තර තර්ජනයක් වනුයේ ඇයි ද යන්න පිලිබඳ ව ගැඹුරු අවබෝධයක් සම්පාදනය කිරීමට විතානගේ අපොහොසත් වෙයි. මෙම දුර්වලතා තිබිය දී ම *ඉර මැදියම* බුද්ධිමත් හා මානව භක්තික චිත්‍රපටයක් වෙයි. එහි ශක්තිය රඳා පවත්නේ සංවේදී හා අන්තර්-දෘක්මෙන් යුත් නිරූපනයන්හි ය. ශ්‍රී ලංකාව තුල වර්ගවාදයට, මිලිටරි කරනයට හා යුද්ධයට පවත්නා ගැඹුරු මහජන විරෝධය මෙම චිත්‍රපටයෙන් ප්‍රකාශයට පත් වෙයි.

© www.wsws.org